චක්‍රලේඛ අංක : 03/2014

මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
121/3,
කිරුළපන මාවත,
කොළඹ 05.

2014-02-28

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස. සමිති සහ අනෙකුත් සියළුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත ,

<u>රාජ්‍ය සේවකයින් හට 2014 අයවැයෙන් වැඩි කළ රු.1,200/- දීමනාව සමූපකාර සේවකයින්ට ලබා දීම.</u>

රාජ්‍ය සේවකයින් සඳහා 2014 අයවැය යෝජනා යටතේ වැඩි කරන ලද රු1,200/- ක ජීවන වියදම් දීමනාව සමූපකාර සේවකයින් සඳහා ද ලබා දෙන ලෙස ඉල්ලීම් ගණනාවක් මෙම කොමිෂන් සභාව වෙත ලැබී ඇත. ඒ සම්බන්ධයෙන්, සමූපකාර සමිති සහ සමූපකාර සේවකයින් වෙතින් ලබා ගන්නා ලද අදහස් කෙරෙහි ද අවධානය යොමු කිරීමෙන් අනතුරුව, බස්නාහිර පළාතෙ හි සියළුම සමූපකාර සේවකයින් සඳහා, 2014-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, පහත සඳහන් විධිවිධානයන්ට අනුකූලව ජීවන වියදම් දීමනාවක් ගෙවීම බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

01.

I පිරිස්බල තක්සේරුවේ අනුමත කර ඇති තනතුරක, ස්ථිර සේවයේ නිරතවන සෑම සමූපකාර සේවකයෙකුටම මසකට රු.1200/- ක ජීවන වියදම් දීමනාවක් ගෙවිය යුතුවේ.

II ඉහත (I) හි සඳහන් උපරිමයට යටත්ව එක් එක් සමිතියේ ආර්ථික ශක්‍යතාවය අනුව ගෙවිය යුතු දීමනාව කොපමණ ද යන්න, සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ හැකිවන අතර ආර්ථික ශක්‍යතාවය දුර්වල සමිතියක සේවකයන් සඳහා වුවද අවම වශයෙන් රු. 500/- ජීවන වියදම් දීමනාවක් ගෙවිය යුතු වන්නේය.

III සමිතියේ සෑම තරාතිරමකම සේවකයෙකු හට ම හිමි විය යුත්තේ, එකම අගයකින් යුත් ජීවන වියදම් දීමනාවකි.

VI විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීමේ දී මෙම දීමනාව අදාල කර ගත යුතු නොවන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක වීම සම්බන්ධයෙන් වන කල් හි, කම්කරු නීති,රීති අනුව කටයුතු කළ යුතු වේ.

02. <u>සාවද්‍ය ගණනය කිරීම</u>

මෙම චක්‍රලේඛයෙන් පරිබාහිරව කිසියම් තැනැත්තෙකුට මොනයම් හෝ වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් ඒ පිළිබඳ ආයතනයේ මූල්‍ය කළමනාකරු / ගණකාධිකාරී පෞද්ගලිකව වගකිව යුතු අතර, ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී. එවැනි සාවද්‍ය වැටුප් පරිවර්තනයක් හෝ ගෙවීම් සිදුකරන වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට අදාල බලධාරීන් ක්‍රියා කල යුතු වේ.

ඩබ්. පී. එම්. ජී. ආර්. ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

1. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
2. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කළා කටයුතු ආහාර සැපයීම් හා බෙදා හැරීම් සමූපකාර සංවර්ධන හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
3. [illegible]